## 431 කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ

කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ
ශුද්ධවූ නගරේ
ජේසු මෙලොවට බිහිවුණේ
පුංචි ගව මඩුවේ //

උඳුවප් මාසේ සීතල දවසක මැදියම් රෑ යාමේ
දෙව් මව් තුරුලේ උණුසුම ලබමින් මේ ලෝකේට ආවේ
සීත සුළං රැළි දසත හමද්දී සැතපිලයි උන්නේ
දුප්පත් එඬේරු මේ බව දැනගෙන ගවලෙන වෙත යන්නේ

මරිය තුමීගේ පෙම්බර මුහුණේ එළියක් දිස්වූයේ
ජුසේතුමා කිසි දාකත් නෑ දෙව් අණකට පිටුපෑවේ
වටපිට රොක් වී උම්බෑ ගාමින් හරකුන් කෑ ගසති
රජ තුන් කට්ටුව බිළිඳු ළග වැටී පඬුරු ඔප්පු කරති

මිනිස් සමාජය පාපෙන් බේරා ගන්නට මෙහි ආවා
දිවැස්වරුන් බොහෝ කලකට පෙර කී දේ ඉන් ඉටුවේවා